සියලුම හිමිකම් ඇවිරිණි |
முழுப் பதிப்புரிமையுடையது |
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 7 ශ්‍රේණිය<br>தரம் 7<br>Grade 7 | කතෝලික ධර්මය I හා II පත්‍රය<br>கத்தோலிக்க சமயம் வினாத்தாள்-1-11<br>Catholicism Paper I & II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |

## 1 කොටස

**වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න** ( ලකුණු 2x20=40)

(01) දස පණතේ 8 වන පණතින් අපට උගන්වන්නේ,

i. ගතින් හා සිතින් පිරිසිදුව ජීවත් වීමටය.

ii. සත්‍යය ප්‍රකාශ කිරීමට හා සත්‍යවාදීව ජීවත් වීමටය.

iii. තම වැඩිහිටියන්ට හා දේශයට ආදරය කිරීමටය.

iv. අන් අයගේ වස්තුවට ඇලුම් නොකිරීමටය.

(02) ජනතා සේවයේ ප්‍රසාද නිධාන වන්නේ,

i. දිව්‍ය සත්ප්‍රසාදය හා අභිවෘද්ධි ආලේපයයි  ii. ආශිර්වාදකාර බන්ධනය හා පූජකවරයයි

iii. පූජකවරය හා අභිවෘද්ධි ආලේපයයි  iv. ප්‍රසාද ස්නාපනය හා පූජකවරයය

(03) පූජකවරය , දේව ප්‍රසාද නිධානය ක්‍රිස්තුත් වහන්සේ විසින් ස්ථාපිත කරනු ලැබුවේ,

i. මහා සිකුරාදා දින කුරුස ගසේදී සිය ජීවිතය පූජා කළ අවස්ථාවේදී

ii. ජෝර්දාන් නදියේ බෞතිස්මය ලැබූ අවස්ථාවේදී

iii. මහා බ්‍රහස්පතින්දා අන්තිම රාත්‍රී භෝජන අවස්ථාවේදී

iv. ශ්‍රාවකයන් ධර්මදූත සේවයට පිටත් කර යැවූ අවස්ථාවේදී

(04) ප්‍රසාද ස්නාපනය දානය කිරීමේදී අත්‍යාවශ්‍ය හා අනිවාර්ය පිළිවෙත වන්නේ,

i. ශුද්ධ වූ ත්‍රිත්වයේ නාමය උච්චාරණය කරමින්, ජලය වත් කිරීම

ii. ක්‍රිස්මා තෙලයෙන් ආලේප කරනු ලැබීම, සුදු වස්ත්‍ර පැළඳවීම

iii. සුදු වස්ත්‍රය පැළඳවීම , පාස්කු ඉටිපහන දැල්වීම

iv. ඥාන මව්පියන් දරුවා වෙනුවෙන් ප්‍රසාද ස්නාපන පොරොන්දු දීම

(05) ශුද්ධෝත්තම පියතුමා විසින් 2015-2016 වසර නම් කර ඇත්තේ

i. දේව විශ්වාසයේ වසර
ii. දේව වචනයේ වසර
iii. පවුල් හා පැවිදි වසර
iv. දයා කරුණාවේ වසර

(06) මුල් කිතුනු සභාවේ දොළොස් වන අපෝස්තුළුවරයා ලෙස ගණන් ගනු ලබන්නේ,

i. ශුද්ධවූ ස්තේපන් මුනිතුමා
ii. ශුද්ධවූ මතියස් මුනිතුමා
iii. ශුද්ධවූ පාවුළු මුනිතුමා
iv. ශුද්ධවූ පේදුරු මුනිතුමා

(07) පැවිදි වේදහාර වන්නේ

i. විශ්වාසය, බලාපොරොත්තුව, ප්‍රේමය
ii. බැගෑපත්කම, කීකරුකම, නිර්භීතකම
iii. කීකරුකම, ව්‍රත ශුද්ධිය, දිළිඳුකම
iv. එඬේරික , දිවැසිවර, පූජක

(08) ජේසුස් වහන්සේගේ ප්‍රථම ශ්‍රාවකයන් ලෙස සලකන්නේ,

i. පේදුරු, ජාකොබ්, මතෙව්, ජොහාන්
ii. පේදුරු, ඇන්ඩෘ, ජාකොබ්, ජොහාන්
iii. පේදුරු, ජොහාන්, මතෙව්, පිලිප්
iv. පේදුරු, ඇන්ඩෘ, සීමොන්, ජාකොබ්

(09) දෙවියන්වහන්සේ , ආබ්‍රහම් තුමා සමග ඇති කරගත් ගිවිසුම ජාකොබ් තුමා සමග නැවත අලුත් කළේ,

i. මිසර දේශයේ දී
ii. හාරාන් හි දී
iii. සීනයි කන්දේ දී
iv. බෙතෙල් හී

(10) "ජාතීන් දෙකක් ඔබ කුස තුළ ඇත. දෙවර්ගයක සෙනගක් ඔබ කුසෙන් නික්මෙති. එක් සෙනගක් අනිකට වඩා බලවත් වෙති. වැඩිමලා බාලයාට මෙහෙ කරනු ඇත." මෙයින් කියැවෙන්නේ,

i. දේව ජනතාව හා අන්‍ය ජනතාව ගැනය
ii. ජෝශප් හා බෙන්ජමින් ගැනය
iii. ඉශ්‍රායෙල් ජනතාව හා මිසර වාසීන් ගැනය.
iv. ඒසව් හා ජාකොබ් ගැනය

(11) උත්ථානු වූ ක්‍රිස්තුන් වහන්සේව සංකේතවත් කරන සළකුණකි.

i. ආශිර්වාදිත ජලය
ii. පාස්කු ඉටිපහන
iii. ශුද්ධ වූ තෛලය
iv. කුරුසියේ ලකුණ

(12) නිනිවයේ වැසියන්ට මනස්ථාපනය වන ලෙස දේශනා කළ දිවැසිවරයා

i. නාතාන්
ii. හොසියා
iii. ජෝනා
iv. එලීෂා

(13) "මෙන්න. මම මෙහිය. මා යැව්ව මැනව" යි පවසමින් දිවැසිවර කැඳවීම භාරත්තේ

i. යොසායා දිවැසිවරයා

ii. ජෙරමියා දිවැසිවරයා

iii. එසකියෙල් දිවැසිවරයා

iv. ආමොස් දිවැසිවරයා

(14) නව ගිවිසුමේ දේව ජනතාව බවට පත් වී දෙවියන් වහන්සේට කැපවන්නේ

i. චර්මඡේදනය මගිනි

ii. පූජකවරය මගිනි

iii. අභිවෘද්ධි ආලේපය මගිනි

iv. ප්‍රසාද ස්නානය මගිනි

(15) කිතුනු විවාහයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ,

i. ප්‍රේමය හා ආගමික භක්තියයි

ii. ඒකත්වය හා අඛණ්ඩභාවයයි

iii. විවාහ පොරොන්දුව හා මුදු පැළඳවීමයි

iv. දේවස්ථානයක , දිව්‍ය පූජාවකදී විවාහ වීමයි

(16) නිල පූජකවරයේ ධූරයන් වන්නේ

i. තේවාචාරී, පූජක, පැවිදි

ii. තේවාචාරී, පැවිදි , රදගුරු

iii. තේවාචාරී, පූජක, රදගුරු

iv. පූජක , පැවිදි, ගිහි

(17) කිතුනු පවුලේ ආදර්ශය

i. සාන්ත සභාවයි

ii. මීසම් පවුලයි

iii. ශුද්ධ වූ පවුලයි

iv. ශුද්ධාත්මයාණන් වහන්සේය

(18) පැවිදි පූජක නිකායන් වන්නේ

i. ශුද්ධ වූ පවුලේ නිකාය, ජේසු නිකාය

ii. සිරිකුරුස නිකාය, නිර්මල මරිය නිකාය

iii. මාරිස්ට් නිකාය, දිව්‍ය සත්ප්‍රසාද නිකාය

iv. නිර්මල මරිය නිකාය, ජේසු නිකාය

(19) සත්‍යයට සාක්ෂි දරමින් දෙවියන් වහන්සේ වෙනුවෙන් කතා කළ නමුත් ශුද්ධ වූ බයිබලයේ තම නමින් ග්‍රන්ථ නොමැත්තේ

i. සුළු දිවැසිවරුන්ටය

ii. දේශක දිවැසිවරුන්ටය

iii. ප්‍රධාන දිවැසිවරුන්ටය

iv. ආදි පියවරුන්ටය

(20) "ජාතීන්ගේ පියාණෝ " ලෙස හඳුන්වන්නේ

i. දෙවියන් වහන්සේ

ii. ඊසාක්

iii. ආබ්‍රහම්

iv. ශුද්ධෝත්තම පියතුමා

## II කොටස

(පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න )

(1) i. නාතාන්, ආමොස්. එලිෂා යන දිවැසිවරුන් විසින් සිදුකළ සේවා දැක්වීමට වාක්‍යයක් බැගින් ලියන්න.

ii. ආබ්‍රහම් තුමා, දේව කැදවීම පිළිගැනීම නිසා මුහුණ දුන් අභියෝග 3 ක් ලියන්න.

iii. ජේසුස් වහන්සේ ස්වර්ගාරෝහණය වීමට පෙර අපොස්තුළුවරුන්ට පැවරූ ධර්මදූත වගකීම කුමක්ද ?

iv. ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන වරප්‍රසාද 3 ක් ලියන්න.

( ලකුණු 3 x 4 = 12)

(2) i. දේව පණත් පිළිපැදීමෙන් අපට අත්වන ප්‍රයෝජන 3 ක් ලියන්න.

ii. සතරවන පණතින් කරන මඟපෙන්වීම් අනුව ඔබ

(අ) දෙමාපියන් (ආ) පාසල (ඉ) රට වෙනුවෙන් ඉටුකළ යුතු වගකීම් 2 බැගින් ලියන්න.

( ලකුණු 6 + 6 = 12)

(3) i. ප්‍රසාද ස්නාපනය ලැබූ ඔබට පොදු පූජකවරය තුළ පැවරෙන තුන් ආකාර කැදවීම් නම් කරන්න.

ii. මීසමේ ක්‍රියාත්මක වන ළමා ඔබට සහභාගි විය හැකි සමිති 3 ක් නම් කර ඒ තුළින් ඔබට ලබාදිය හැකි සේවා 2 ක් බැගින් ලියන්න.

( ලකුණු 6 + 6 = 12)

(4) i. "මා අනුව එන්න. මම ඔබ මිනිසුන් දිනා ගන්නන් කරමි" යන කැදවීමට කීකරු වූ ජේසුස් වහන්සේගේ ප්‍රථම ශ්‍රාවකයන් තුළ ඇති වූ වෙනස්කම් 3 ක් ලියන්න.

ii. ළමා ධර්මදූතයෙක් ලෙස ඔබට දේව වචනය ප්‍රකාශ කළ හැකි ආකාර 6 ක් ලියන්න.

(ලකුණු 6 + 6 = 12)

(5) i. ආබ්‍රහම් තුමා විසින් තම පුත් ඊසාක් පූජා කිරිමේ සිද්ධිය ඇසුරෙන් ඔබට ගත හැකි පණිවුඩ 3 ක් ලියන්න.

ii. ඔබ ලබා ඇති අසීමිත දේව වරප්‍රසාද උදෙසා තුති පිදිමේ යාච්ඤාවක් ලියන්න.

(ලකුණු 6 + 6 = 12)

(6) i. දිව්‍ය සංරක්ෂණය අත්දුටු දිවැසිවරයෙකු නම් කර , එතුමා දිව්‍ය සංරක්ෂණය අත්දුටු ආකාරය කෙටියෙන් ලියන්න. ( පේළි තුනකින් පමණ )

ii. කිතුනු දරුවෙකු ලෙස නායකත්වය ගෙන කටයුතු කිරිමේදී ගොඩනගා ගත යුතු නායකත්ව ගුණාංග 6 ක් ලියන්න.

(ලකුණු 6 + 6 = 12)

The National e-Learning Portal for General Education

(7) i. "හෘද සාක්ෂිය දේව හඬයි" එය ආලෝකමත් කරගත හැකි ආකාර 3 ක් ලියන්න.

ii. පහත අවස්ථාවලදී ඔබ ක්‍රියාකරන ආකාර 2 බැගින් ලියන්න.

(අ) ඔබේ පංතියේ සිසුවකු නොමඟ යන අවස්ථාවක

(ආ) අන් අයකුගේ මුදල් පසුම්බියක් ඔබ ඇහුලූ විට

(ඉ) ඔබේ ජීවිතය දුක් කරදර වලින් පිරී ඇති විටක

(ලකුණු 6 + 6 = 12)

(8) i. ඔබේ මීසමේ පියතුමා, ඔබ මීසම් පවුල වෙත ලබාදෙන සේවා 3 ක් ලියන්න.

ii. දේව වරප්‍රසාද අයදමින් ගැයෙන ගීතිකාවකින් කොටසක් ලියන්න.

(ලකුණු 6 + 6 = 12)

e-තක්සලාව The National e-learning Portal for The General Education